**රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදල - 2016**

---

ශ්‍රී ලංකා රේගුවේ රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. රේගු දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදලෙහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්ත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

-----------------------------------------------

(i) ප්‍රමිතයේ 21 (ඉ) ප්‍රකාරව, අතිරේක මූල්‍ය ප්‍රකාශනයක් වශයෙන් අය වැය ගත සංඛ්‍යා සහ සත්‍ය සංඛ්‍යා අතර සංසන්දනයක් හෝ මූල්‍ය ප්‍රකාශන වල අයවැය ගත සංඛ්‍යාවන් වෙනම තීරුවක් ලෙස හෝ ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) අතිකාල අරමුදල වෙනුවෙන් පිළියෙල කරන ලද හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය තුළ, මූල්‍ය ප්‍රකාශන අදාළවන කාලපරිච්ඡේදය සහ මුදල් ඒකකය සඳහන් කර නොතිබුණු අතර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන කට්ටලය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයක් ද පිළියෙල කර නොතිබුණි. ඒ අනුව, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඉහත ප්‍රමිතයේ උපදෙස් නිසි පරිදි පිළිපැද ඇති බවක් නිරීක්ෂණය නොවීය.

(iii) ප්‍රමිතයේ 48 වගන්තිය ප්‍රකාරව, ප්‍රමිති මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක හැර වත්කම් හා වගකීම් හා ආදායම් සහ වියදම් හිළව් නොකළ යුතු වුවත් 2016 දෙසැම්බර් 31 දිනට රු.209,942,470 ක ණයගැති හර ශේෂ සහ රු.101,090 ක ණය ගැති බැර ශේෂ එකිනෙකට හිලව් කර ශුද්ධ අගය වූ රු.209,841,380 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(iv) ප්‍රමිතයේ 45 ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනවල සෑම ප්‍රමාණාත්මක සමාන අයිතම පන්තියක්ම වෙන්වෙන්ව ඉදිරිපත් කළ යුතු වුවද නැව්බඩු පරීක්ෂණ ගාස්තු අරමුදලින් හා තොරතුරු තාක්ෂණ අරමුදලින් සමාලෝචිත වර්ෂයට අදාළව නිලධාරීන්ට ගෙවිය යුතුව පැවති පිළිවෙලින් රු.79,933,557 ක් හා රු.998,400 ක් අදාළ වියදම් විෂයයන් යටතේ වෙන් වශයෙන් හඳුනාගෙන ගිණුම්ගත කිරීම වෙනුවට රු.80,931,956 ක් වූ සම්පූර්ණ වටිනාකම වෙනමම ආදායම් ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02

-----------------------------------------------------

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී සමාලෝචිත වර්ෂයට අදාළ රු. 1,943,123 ක අඩමාන ණය ඌන වෙන් කිරීම සහ ණයගැතියන්ගේ දළ අගය මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගැලපීමට කටයුතු නොකර ණයගැතියන්ගේ ශුද්ධ වටිනාකම මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගලපා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

-------------------------

ණය ගැතියන්ගේ පැවැත්ම හා ආයුකාලය සැළකිල්ලට ගැනීමකින් තොරව අඩමාන ණය සඳහා වෙන් කිරීමේදී සියළුම ණය ගැතියන් සඳහා සියයට 15 ක පොදු රේටයක් මත ප්‍රතිපාදන සලසා තිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නැව්බඩු පරීක්ෂණ ගාස්තු අරමුදලේ ආදායම් ප්‍රකාශනය තුළ ශ්‍රී ලංකා රේගුවේ එක් එක් අංශයන් අනුව, ආදායම වාර්තා කර තිබුණද, ඒ සියලුම අංශයන්ට අදාළව සමාලෝචිත වර්ෂය තුළ ආපසු ගෙවා ඇති රු.495,809 ක මුදල එක් එක් අංශයන්ගේ ආදායමට එරෙහිව ගැළපීම වෙනුවට අරමුදලේ සමස්ත ආදායමින් අඩුකර දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ශ්‍රී ලංකා රේගුවේ විවිධ ආදායම් ශීර්ෂය යටතේ ඇතුළත් රු.25,895,605 ක ආදායමින් මෙම අරමුදලට උපචිත විය යුතු අගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පැවති වටිනාකම් සහ ඊට අනුරූප උප අරමුදල්වල මුදල් ප්‍රවාහ ප්‍රකාශනවල පැවති වටිනාකම් අතර රු.499,200 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආදායම් ප්‍රකාශනය තුළ අතිකාල ආදායම උපචිත පදනමින් දැක්වීමටත් ඊට අදාළ උපලේඛනයේ මුදල් පදනමින් දැක්වීමත් නිසා රු.12,966,543 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

------------------------------------

සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.79,933,556 ක් වූ ගෙවිය යුතු බහාළුම් පරීක්ෂණ ගාස්තු රු.349,140 ක් වූ වගකීම් සහ රු.46,259,055 ක් වටිනා අංක AE–OT–03 දරන ජ'නල් සටහන සඳහා අවශ්‍ය උපලේඛන හා පැහැදිලි කිරීම් කිසිවක් විගණනයට ඉදිරිපත් නොවීය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට ආයතන 149 කින් අයවිය යුතුව පැවති ණයගැති ශේෂයන්ගේ එකතුව රු.209,841,380 ක් වූ අතර එම ණයගැතියන්ගෙන් රු.23,180,736 ක් හෙවත් සියයට 11 ක් ම වර්ෂ 10 ඉක්මවූ ණයගැති ශේෂ විය. තවද, මුළු ණය ශේෂයෙන් සියයට 90 ක් වූ එකතුව රු.188,391,441 ක් ප්‍රධාන ආයතන 13 කින් අරමුදලට අයවිය යුතුව පැවති ශේෂ විය. කෙසේ වුවද, හිඟ මුදල් වලින් රු.61,880,400 ක් මෙම වාර්තාවේ දින වන විට අයවී ඇති බව විගණනයට වාර්තා කර ඇති අතර තවදුරටත් පවතින හිඟ ණය අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.**

2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරන ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්ගෙන්ද විමසා මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් වරින් වර තීරණය කරනු ලබන ගෙවීම් ප්‍රමාණවලට අනුකූලව අතිකාල ගෙවීම් සිදු කල යුතු වුවද, ශ්‍රී ලංකා රේගුවේ අතිකාල ගෙවීම් සඳහා එවැනි අනුමැතියක් ලබාගෙන නොතිබුණි. එසේම, 2013 වර්ෂය දක්වා ගෙවමින් පැවති අතිකාල දීමනා අනුපාතයන් දෙපාර්තමේන්තුවේ අතිකාල කමිටුව විසින් 2013 වර්ෂයේදී තවදුරටත් සියයට 45 කින් වැඩිකර ගෙවීම සඳහා ඉඩ සලසා දී තිබුණද ඒ සඳහා ද නිශ්චිත අනුමැතියක් ලැබී නොතිබුණි. ඒ අනුව, නිශ්චිත අනුමැතියකින් තොරව ශ්‍රී ලංකා රේගුව විසින් වර්තමානයේ අතිකාල ගෙවීම් කිරීමේදී පැය 24 ක නිවාඩු දිනයක් සඳහා පැය 27 ක අතිකාල ගෙවීමක්ද සාමාන්‍ය වැඩ කරන දිනයක් සඳහා පැය 18 ¾ දක්වා වූ අතිකාල ගෙවීම් ද සිදුකර තිබුණි.

එමෙන්ම, රේගු ආඥාපනතේ 103 වගන්තිය ප්‍රකාරව නිකුත්කරන ලද 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව, රේගු අතිකාල අරමුදලට රැස්කරන මුදල්වලින් රේගු කාර්ය මණ්ඩලයට පමණක් ගෙවීම් කළ හැකි වුවද රේගු කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවන බාහිර ආයතනවල කාර්ය මණ්ඩලය සඳහාද මෙම අරමුදල යටතේ අතිකාල ගෙවීම් සිදු කර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.241,772,052 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.190,195,551 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.51,576,501 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව අරමුදලේ ආදායම සියයට 03 කින් හෙවත් රු.36,972,959 කින් වැඩි වීම හා අරමුදලේ වියදම් සියයට 1.5 කින් හෙවත් රු.14,603,542 කින් අඩුවීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

රේගු ආඥාපනතේ 103 වගන්තිය අනුව නිකුත්කරන ලද 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 ගැසට් නිවේදනය ප්‍රකාරව, නිලධාරීන් විසින් සාමාන්‍ය රාජකාරී වේලාවන් වලින් පරිබාහිර වේලාවන්වලදී කරනු ලබන රාජකාරී වෙනුවෙන් සහ සාමාන්‍ය රාජකාරී ස්ථානවලින් බාහිර ස්ථාන වලදී ඉටුකරනු ලබන රාජකාරී වෙනුවෙන් විවිධ පාර්ශවයන්ගෙන් අයකරනු ලබන ගාස්තු හා අයකිරීම්ද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට තාක්ෂණික සේවා සැපයීම වෙනුවෙන් එම ආයතනයෙන් අයකරනු ලබන ගාස්තුද අරමුදලට බැර කළයුතු වේ. එසේම, එම අතිරේක රාජකාරී වෙනුවෙන් නිලධාරීන්ට කරනු ලබන ගෙවීම් මෙම අරමුදලේ වැය බරක් සේ සලකනු ලැබේ.
සමාලෝචිත වර්ෂය තුළ ඉහත සඳහන් පරිදි අතිකාල, නැව්බඩු පරීක්ෂණ හා තොරතුරු තාක්ෂණ කටයුතු වෙනුවෙන් පිළිවෙලින් රු.892,733,942 ක්, රු.312,561,714 ක් හා රු.14,976,000 ක් රැස්කර තිබූ අතර එම වැඩ කටයුතු සඳහා නිලධාරීන්ට පිළිවෙලින් රු.561,042,027 ක්, රු.156,280,857 ක් හා රු.11,980,800 ක් ගෙවා තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1967 වර්ෂයේ සිට 1973 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා රේගුව විසින් සේවා සැපයූ ආයතන 75 කින් ලබාගෙන තිබූ රු.253,314 ක් වූ මූලික තැන්පතු ඉතිරි කිරීමේ ගිණුම්වල ආයෝජනය කිරීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලැබී තිබුණු පොලිය රු.12,661,650 ක් විය. මෙම වටිනාකම ආපසු ගෙවිය යුතු තැන්පතු ලෙස වාර්තා කර තිබුණද, අදාළ තැන්පතු අයත් ආයතනයන්හි පැවැත්ම පිළිබඳ කිසිදු විමර්ශනයක් සිදු කර නොතිබූ අතර එම ශේෂ නිරවුල් කිරීමට ද විධිමත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.

(ආ) අතිකාල සේවයේ යෙදවීම හා ගෙවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව විසින් ක්‍රියාත්මක කරන අභ්‍යන්තර පාලන ක්‍රමවේදය දුර්වල මට්ටමක පැවති අතර එම නිසා අතිකාල ලේඛනයේ අත්සන් කළ පමණින් අතිකාල හිමිකම් ලබා ගැනීමට නිලධාරීන්ට අවස්ථාව සැලසී ඇති බව නිරීක්ෂණය විය. මෙම අභ්‍යන්තර පාලන දුර්වලතා පිළිබඳව වර්ෂ ගණනාවක සිට විගණන විමසුම් හා විගණන වාර්තා මගින් පෙන්වා දී තිබුණද එම තත්ත්වය විධිමත් කිරීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තා හා මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත විගණනයට ඉදිරිපත්කළ යුතු විය. එහෙත් මෙම අරමුදලේ සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ 2017 ජුනි 05 දිනදීය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | අතිකාල ගෙවීම් පාලනය | (i) | අතිකාල ගෙවීම් සඳහා නියමිත අනුමැතීන් ලබා ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් නොවීම හා අතිකාල සේවයේ යෙදවීම, ලේඛන පවත්වා ගැනීම, අධීක්ෂණය හා ගෙවීම් කිරීම විධිමත්ව සිදු නොවීම. |
| (ආ) | ගිණුම්කරණය | (i) | ණය ගැති පාලන ගිණුම් පවත්වාගෙන නොයාම. |
| | | (ii) | ජ'නල් සටහන් යෙදීමේදී වටිනාකම සම්බන්ධයෙන් නිශ්චිත පිළිගත් සීමාවන් කළමනාකරණය විසින් තීරණය නොකිරීම. |